


අහස් ගව්වට මෙහායින් අවකාශය පුරාම ගන්ධබ්බයින්ගේ ලෝකය වෙයි. පොළොව පුරාම මිනිස් ශරීර වලට බද්ධව එහා මෙහා යන, කොහේදෝ අවකාශයේ හිඩැසකින් දිව ආව, ආත්මය පුරා, වැට කොටු මැද දිවෙන පංචස්කන්ධයින් දෙස බලමින් ගන්ධබ්බයෝ කුමක් සිතත් දැයි එක පාරටම සිතුවිල්ලක් මට ඇති වෙයි. ඔවුහු හිනැහෙත් ද? හඬත් ද? වැළපෙත් ද? ඊර්ෂ්‍යා වෙත් ද? නැතහොත් මේ සියල්ල කැටි කොට පුපුරා යත් ද?

තැන තැන බිම් තලාව අරා මල් පිපී එයි. විහඟ ගී ඇසෙයි. බඹරු සුපිපි මල් වට කැරකෙත්. මී මැස්සෝ මී සොයා ඉගිලෙත්.

වසන්තය එළැඹෙයි.
අරුණළු පැතිරෙයි.
පිණි සිහිල විසිරෙයි.

කිරිකැටි දරුවෝ කිරට හඬත්. උන් අම්මාවරු නගරයට ඇදෙත්. උන්ගේ මව්වරු දරු නැළවිලි අමතකව විස්සෝප වෙත්. කිරිකැටියෝ නිදි නැතිව, හඬ හඬා සිහින දකිත්.

මහ මග සිරුරු පොඩි වී රුහිරු ගලා යයි. රතු පාට ගංගාවෝ නෑ ගම් යයි. ගන්ධබ්බයෝ හිනැහෙත්.

සාද සැන්දෑව අපූරුවට ගෙවී යයි.
දියට සැඳූ පරිප්පු හොද්ද සුවඳ පතුරවයි.
හැකිළී ගිය දරුවෝ කොපි පොත් වල හිස් පිටු පීරමින් අකුරු ලියන්නට තතනයි. අකුරු පොඩි ඇද වී, වැරදී යයි. මැල වී ගිය බිළිඳු සිනාවක්වත් නැති සැටියක.

දිව්‍ය ලෝකය සාලය මැද තැනෙයි. නෙක පාට ගැලපීම් විසිතුරුය. සියළු දෑ සැණෙකින් මවන කප් රුක සාලය මැද ලොකු පෙට්ටියක් තුළට වී සතුටු සිනා මවයි. සියල්ල මොහොතින් අමතක වෙයි. සිත සුව පිණිස නිළ දරුවෝ ද, මැති ඇමතිවරු ද සැනසිලි ගී ගයති. ප්‍රීතියෙන් සිත පිනා යයි. කුසට අහරක් මොට ද?
අහෝ මිනිස් පුරයක අසිරිය!
ගන්ධබ්බයෝ හිනැහෙත්, ඉහළ අවකාශයේ සිටම.

පැල්පත් ගලවා ඉවත් කෙරේ. රජ දරුවෝ වැඩම කරති. අහිංසක සිනා මුව රැඳි, පිංබර මුහුණු පලස දිග ඇවිදිති, මොටෝ රථයෙන්. තව්තිසාව දැයි මොහොතකට සිත රැවටෙයි.

පොල් රුප්පාව යට වස්දඬුව ගත් තරුණයෙකු කල්පනාවක සිටිනු පෙනෙයි. තත් සර බිඳී ගිය වෙද සුසුම් අවකාශය පුරා දුව යයි.

කවක් හිත යට, පතුලටම වී, ගොඩ එනු නොහැකිව මිය යයි. සුස්මක සිර වී මිය ගිය කව මෙපුර දුටු සඳ, තම සිරුර දෙස බලා සැනසෙයි. මේ මහා ව්‍යසනය කෙසේ නම් සිදු වුණිදැයි වික්ෂිප්තව කවි සිත ද, කවි සිරුරෙන් වෙන් වී ඉහළටම ඇදෙයි. ගන්ධබ්බයෝ සතොසින් බාල් නටත්.

නා නා බරණින් සැරසුණ සුරඟනාවෝ, දෙවඟනාවෝ, නා නා විධ වාහන වල නැගී බස් රථයක පොරකන අමුතු මිනිසුන් දැක කඳුළු සලති. ඔවුන් සිත සලිත වී යයි. එහා මෙහා කලබලයෙන් දුවන මගියෝ එම වාහන වල ගැවී යති. එකෙකු ලවා ගෙදර ගිය සැණින් රථය සෝදවා ගන්නට අයෙක් කල්පනා කරති.

**දිව්‍ය ලෝකය සාලය මැද තැනෙයි. නෙක පාට ගැලපීම් විසිතුරුය. සියළු දෑ සැණෙකින් මවන කප් රුක සාලය මැද ලොකු පෙට්ටියක් තුළට වී සතුටු සිනා මවයි. සියල්ල මොහොතින් අමතක වෙයි. සිත සුව පිණිස නිළ දරුවෝ ද, මැති ඇමතිවරු ද සැනසිලි ගී ගයති. ප්‍රීතියෙන් සිත පිනා යයි. කුසට අහරක් මොට ද?**
**අහෝ මිනිස් පුරයක අසිරිය!**

අසූචි පිරුණු කාණු දිග නරයෝ දිය කෙළිත්.
නෙළුම් මල් කඩා, පා ගා විනාශ කර දමති.
ගොවිබිම් සරුසාරව, කෙත් යාය සුවඳ බෙදයි.
ගම වෙනස් වී යද්ද?

කිසිවක්ම දරා ගත නොහී කම්මැලියා අනුන ගේ කකුළෙන් අදිමින් සිටී. ඊර්ෂ්‍යාවෙන් අන්ධව සියල්ලම හප කර දමමින් සිටියි.
එකිනෙකා තලා දමා, මරා දමා ඔහු සැනසෙයි..
හැදියාව, සදාචාරය වචන වලට සිරව පොත් තුළ ඉකි බිඳී.
පුදසුන් මත පරමල් වේළී යයි.
ලෙන්ගතු හදවත් ඇත්තෝම මියෙති දැයි අසන්නට සිතේ. සෙස්සෝ කොයිබ දැයි කෙසේ සොයමු ද?

සමාජය උඩු යටිකුරු වී ඇත.
සියල්ල කැටි වී පුපුරා ගිය අංගවිලක ගන්ධබ්බයෝ ම බිළිඳු ශරීර වලට රිංගා ගනිති.

අහෝ !

***ලියා තැබුවේ,***

තුෂාරි ප්‍රියංගිකා




FM 94.1
**ලක් මිහිර** South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න




